## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

### තනතුරු පුරප්පාඩු

### ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ “කළමනාකරණ සහකාර” – (තාක්ෂණ) සේවා ගණය - පුස්තකාලයාධිපති තනතුර (01) සඳහා බඳවාගැනීමට අයදුම්පත් කැඳවීම.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ “කළමනාකරණ සහකාර” – (තාක්ෂණ) සේවා ගණය පුස්තකාලයාධිපති තනතුර (01) සඳහා බඳවාගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:**

**බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්**

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා තුනෙන් එකකට අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් තිබීම.

ii. ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වීම. මින් විෂයයන් පහක් (05) එකවර සමත්ව තිබීම.

ඊට අමතරව අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක් (03) සමත්ව තිබීම.

iii. පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතාවයක් ලබා තිබීම.

වයස

වයස අවුරුදු දහඅටට (18) නොඅඩු සහ අවුරුදු හතලිස් පහට (45) නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).

වැටුප් පරිමාණය

MA 2 – 2 – 2016 රු. (30310-10x300-7x350-4x600-20x710-52360)

බඳවාගැනීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා විසින් නම් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**සේවා කොන්දේසි**

1. මෙම තනතුර වසර තුනක පරිවාස කාලයකට යටත් ස්ථිර තනතුරක් වේ.
2. සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම්කිරීමේ පටිපාටිය :**

අයදුම්කරු විසින්ම සකස් කරගන්නා අයදුම්පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට 2021.03.25 වන දිනට හෝ එදිනට පෙර මෙහි පහත සඳහන් ලිපිනයට ලියාපදංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර සහ මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී නැතිවූ බවට සඳහන් කරමින් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව ලබාදෙන දුරකථන ඇමතුම් හෝ වෙනත් පෞද්ගලික මට්ටමේ ඇමතුම් කිසිවක් භාරගනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,**
**අංක 80, අධිකරණ මාවත,**
**කොළඹ 12.**

Source: www.judgesinstitute.lk (2021.02.22)